ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ஊவா மாகாண கல்வித் திணைக்களம்
UVA PROVINCIAL DEPARTMENT OF EDUCATION

# පෙරහුරු පරීක්ෂණය - 2017

| 11 ශ්‍රේණිය | ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය - I පත්‍රය | කාලය පැය 01 |
|---|---|---|

**සැළකිය යුතුයි:-**

I. සියළුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
II. අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති පිළිතුරුවලින් නිවැරදි පිළිතුර තෝරන්න.

---

"පුද්ගලයන්ගේ ජීවන රටාව අවශ්‍යතා හා වුවමනා සපුරා ගැනීම මත රඳාපවතී."

01. අවශ්‍යතාවල ලක්ෂණයක් නොවන්නේ,
   I. අවශ්‍යතා පොදු වේ.
   II. අවශ්‍යතා සීමිත වේ.
   III. අවශ්‍යතා නිර්මාණය කල හැකිය.
   IV. ජීවත් වීම සඳහා අවශ්‍ය වේ.

02. නිෂ්පාදනය යනුවෙන් හඳුන්වන්නේ,
   I. ස්වභාව ධර්මයෙන් ලැබී ඇති සම්පත් පවත්නා ආකාරයෙන්ම භාවිතා කිරීම.
   II. කෘෂිකාර්මික, කාර්මික සේවා නිෂ්පාදනය
   III. පාරිභෝගික අවශ්‍යතා අනුව සම්පත් වල ස්වරූපය වෙනස් කරමින් එම සම්පත්වලට වටිනාකමක් එක් කිරීම.
   IV. ප්‍රාථමික කර්මාන්ත වලින් ලබා ගන්නා ද්‍රව්‍ය වෙනස්කම් වලට භාජනය කිරීම.

ටානියා ප්‍රභාශ්වරී "ප්‍රභා නිෂ්පාදන" නමින් පාසල් බෑග් සහ පාසල් ළමුන් සඳහා පාවහන් නිෂ්පාදනයේ නිරත වෙයි. ප්‍රදේශයේ තරුණියන් තිදෙනෙකු සේවයට බඳවා ගෙන ඇත."

03. මෙම ව්‍යාපාරයට ඇල්මක් දක්වන පාර්ශවයක් නොවන්නේ,
   I. ප්‍රදේශයේ පාසල් ළමුන්
   II. සේවකයන්
   III. ව්‍යාපාරයේ අයිතිකරු
   IV. උක් වගාවේ නිරතවන ගොවීන්

04. ටානියාගේ මෙම ව්‍යාපාරය,
   I. සේවා සපයන ව්‍යාපාරයකි.
   II. ලාභ අරමුණු කර නොගත් ව්‍යාපාරයකි.
   III. භාණ්ඩ නිෂ්පාදන ව්‍යාපාරයකි.
   IV. අදහස් සපයන ව්‍යාපාරයකි.

05. මෙම ව්‍යාපාරයෙන් ආර්ථිකයට අත්වන ප්‍රතිලාභයක් නොවන්නේ,
   I. සේවා නියුක්තියට දායක වීම.
   II. ආර්ථික වර්ධනයට දායක වීම.
   III. උපරිම ලාභයක් ඉපයීම.
   IV. ප්‍රදේශයේ සම්පත් උපයෝගි කර ගැනීම.

"සුමුදු රුක්මාල් ප්‍රදේශයේ කීර්තිමත් ව්‍යාපාරිකයෙකි. ඔහු ව්‍යාපාර පරිසරය පිළිබඳව නිතර විමසිලිමත්ව සිටී. එය ඔහුගේ ව්‍යාපාරයේ සාර්ථකත්වයට හේතු වී ඇත."

06. ආර්ථික පරිසර සාධක පමණක් ඇතුලත් පිළිතුර තෝරන්න.
   I. උද්ධමනය, පොලී අනුපාතය, මධ්‍යම පරිසර අධිකාරිය
   II. පොලී අනුපාතය, අණපනත්, ආදායම
   III. අණපනත්, උද්ධමනය, පොලී අනුපාතය

www.edudept.up.gov.lk

IV. උද්ධමනය, පොලී අනුපාතය, ඉතුරුම්

07. අභ්‍යන්තර පරිසරයට අයත් වන පාර්ශව වන්නේ ,
I. ගනුදෙනුකරුවෝ, තරඟකරුවෝ, අයිතිකරුවෝ
II. අයිතිකරුවෝ, කළමනාකරුවෝ, සේවකයන්
III. සේවකයෝ, පාරිභෝගිකයෝ, තරඟකරුවෝ
IV. කළමනාකරුවෝ, සේවකයෝ, ගනුදෙනුකරුවෝ

08. ඒක පුද්ගල ව්‍යාපාර වලට අදාළ වන නෛතික ලේඛනයකි.
I. 2007 අංක 07 දරණ සමාගම් පනත
II. 1972 අංක 05 දරණ සමූපකාර පනත
III. 1918 අංක 06 දරණ ව්‍යාපාර නාම ආඥාපනත
IV. ඉහත සියළුම ලේඛන

09. පහත එක් එක් රටට නියමිත මුදල් වර්ග අතරින් නිවැරදි නොවන පිළිතුර තෝරන්න.
I. ඉතාලිය - ලීරා
II. ජපානය - ඩොලර්
III. චීනය - යුවාන්
IV. බ්‍රිතාන්‍ය - පවුම

10. පහත කාණ්ඩ අතරින් වාණිජ බැංකු පමණක් ඇතුලත් කාණ්ඩය තෝරන්න.
I. සම්පත් බැංකුව, ජාතික ඉතිරි කිරීමේ බැංකුව, මහජන බැංකුව
II ලංකා බැංකුව, ජාතික ඉතිරි කිරීමේ බැංකුව, මහජන බැංකුව
III. ලංකා බැංකුව, සම්පත් බැංකුව, මහජන බැංකුව
IV. මහජන බැංකුව, ශ්‍රී ලංකා මහ බැංකුව, ලංකා බැංකුව

11. චෙක්පතක චුම්භක තීන්ත අක්ෂර හැඳුනුම් තීරුවේ දැක්වෙන අයිතම පහත දක්වා ඇත.
A. චෙක්පත් අංකය
B. බැංකු ශාඛා අංකය
C. බැංකුවේ අංකය
D. බැංකු ගිණුම් අංකය

මේවායේ අනුපිළිවෙල වන්නේ,
I. A,D,C,B
II. A,C,B,D
III. A,B,C,D
IV. A,D,B,C

12. රක්ෂණ මූලධර්ම යටතට අයත් නොවන්නේ,
I. උපරිම විශ්වාසය
II. රක්ෂණ හිමිකම
III. හානි පූර්ණය
IV. රක්ෂණ වටිනාකම

13. සැලසුම්කරණය යනු,
I. ව්‍යාපාරයක අරමුණු ඉටු කර ගැනීමයි
II. ව්‍යාපාරයක අරමුණු තීරණය කිරීමයි
III. අරමුණු තීරණය කිරීම හා අරමුණු ඉටු කිරීම සඳහා සුදුසු ක්‍රියා මාර්ග ගැනීමයි
IV. සේවකයන් පාලනය කිරීමයි

14. ව්‍යාපාරයක සේවකයන් කල යුතු කාර්යය පිළිබඳව ඔවුන් යොමු කිරීම අයත් වන්නේ,
I. මෙහෙයවීම
II. සැලසුම්කරණයට
III. සංවිධානකරණයට
IV. පාලනයට

15. කොටස් මිලදී ගත් ආයෝජකයකු ඒවා ගත් මිලට වඩා වැඩි මිලකට විකිණීමෙන් ලැබෙන වාසිය හඳුන්වන්නේ,
I. විකුණුම් මිල ලෙස
II. ලාභාංශ ලෙස
III. ආදායම් ලෙස
IV. ප්‍රාග්ධන ලාභය ලෙස

16. සාමාන්‍ය කොටස් වල ආයෝජනයෙන් ලැබෙන ප්‍රතිලාභයක් නොවන්නේ,
I. ලාභාංශ ආදායම් ලැබිය හැකි වීම
II. ඇප සුරැකුමක් ලෙස ඉදිරිපත් කල හැකි වීම
III. සාමාන්‍ය කොටස් නැවත විකිණිය හැකි වීම

www.edudept.up.gov.lk

IV. කොටස් හිමියන්ට රජයෙන් සහතිකයක් ලැබීම

නවෝද්‍යාගේ ව්‍යාපාරයේ 2016.12.31 දිනට පහත ශේෂ ලැබුනි.

| | |
|---|---|
| ලිඛඩු උපකරණ | - රු.50000.00 |
| මුදල් | - රු.20000.00 |
| ණය ගැතියෝ | - රු.12000.00 |
| බැංකු ණය | - රු.75000.00 |
| ණය හිමියෝ | - රු.16000.00 |
| උපචිත රක්ෂණ ගාස්තු | - රු. 4000.00 |

17. මෙම ව්‍යාපාරයේ මුළු වත්කම් වල වටිනාකම වන්නේ,
 I. රු.82000.00  II. රු.70000.00
 III. රු.50000.00  IV. රු.32000.00

18. නවෝද්‍යාගේ ව්‍යාපාරයේ ජංගම වගකීම්වල අගය
 I. රු.75000.00  II. රු.32000.00
 III. රු.20000.00  IV. රු.16000.00

"සෙත්විමනි"ව්‍යාපාරයේ 2016 වර්ෂයේ තොරතුරු කිහිපයක් පහත දැක්වේ.

| | | |
|---|---|---|
| ප්‍රාග්ධනය -රු. 150000.00 | ගැනිලි - රු. 2000.00 | ශුද්ධ ලාභය - රු. 20000.00 |
| දළ ලාභය - රු. 60000.00 | ජංගම නොවන වත්කම් - රු. 100000.00 | මුළු වත්කම් - රු. 160000.00 |

19. මෙම ව්‍යාපාරයේ හිමිකම වන්නේ,
 I. රු. 190000.00  II. රු. 168000.00
 III. රු. 148000.00  IV. රු. 80000.00

20. මෙම ව්‍යාපාරයේ වර්ෂයට අදාල ජංගම වත්කම්වල වටිනාකම,
 I. රු. 80000.00  II. රු. 60000.00
 III. රු. 40000.00  IV. රු. 22000.00

21. මුදල් ගිණුමකින් සිදුවන කාර්යකි,
 I. වවුචරයක් ලෙස කටයුතු කිරීම
 II. මුලික සටහන් පොතක් ලෙස කටයුතු කිරීම
 III. බැරපතක් ලෙස කටයුතු කිරීම
 IV. බැංකු ගනුදෙනු සටහන් කිරීම

22. සුළු මුදල් අග්‍රිමය පිළිබඳ නිවැරදි ප්‍රකාශය තෝරන්න.
 I. ප්‍රධාන මුදල් භාරකරු පොත්වල සටහන් කරන මුදලකි
 II. ණයට ගැනුම් සටහන් කිරීමට ලබා දෙන මුදලකි
 III. ප්‍රධාන මුදල් භාරකරු නිශ්චිත කාලච්ඡේදය ආරම්භයේ සුළු මුදල් භාරකරුට ලබා දෙන මුදලකි
 IV. ප්‍රධාන මුදල් භාරකරු නිශ්චිත කාලච්ඡේදය ආරම්භයේ කළමනාකරුට ලබා දෙන මුදලකි

23. රු.5000.00ක ගැණුම් ඉන්වොයිසියක් පොත්වල දෙවරක් සටහන් වීම නිවැරදි කිරීමට අදාළ නිවැරදි ජ'නල් සටහන වන්නේ,
 I. ගැණුම් හර 5000 - ණය ගැතියෝ බැර 5000
 II. ගැණුම් හර 5000 - ණය හිමියෝ බැර 5000
 III. ණය හිමියෝ හර 5000 - අවිනිශ්චිත ගිණුම බැර 5000
 IV. ණය හිමියෝ හර 5000 - ගැණුම් බැර 5000

24. ව්‍යාපාරයක ස්ථාවර වත්කමක් ණයට විකුණන විට සටහන් කරන මුලික පොත,
 I. මුදල් පොත  II. බැංකු ගිණුම
 III. විකුණුම් ජ'නලය  IV. පොදු ජ'නලය

www.edudept.up.gov.lk

25. පහත සඳහන් වියදම් අතරින් ප්‍රාග්ධන වියදමක් ලෙස සැලකිය හැක්කේ,
   I. ලී බඩු අළුත් වැඩියාවට වැය වූ මුදල
   II. ලී ඩබු ව්‍යාපාරයට ගෙන ඒමේ වියදම
   III. ලී බඩු මිළ දී ගැනීමට වැය වූ මුදල
   IV. ලී බඩු විකිණීමේදී ලබා දුන් කොමිස් මුදල

26. විරාජ්ගේ ව්‍යාපාරයේ ණය ගැතියෙකු වූ කසුන් අතුරුදහන් වීම නිසා ඇති වූ රු.15000.00ක මුදල බොල් ණය ලෙස කපා හැරීමට තීරණය කරයි. එයට අදාලව ද්විත්ව සටහන වන්නේ,

| | | |
|---|---|---|
| I. | විරාජ්ගේ ගිණුම හර | - බොල් ණය ගිණුම බැර |
| II. | කසුන්ගේ ගිණුම බැර | - බොල්ණය ගිණුම හර |
| III. | බොල් ණය ගිණුම හර | - බොල් ණය වෙන් කිරීම් ගිණුම බැර |
| IV. | කසුන්ගේ ගිණුම හර | - මුදල් ගිණුම බැර |

ප්‍රවීන් අනුරාධ තම ව්‍යාපාරයේ රු.100000.00ක් වටිනා යන්ත්‍ර මිළදී ගනී. ඒවායේ ජීව කාලය වර්ෂ 10කි. ජීව කාලය අවසානයේ යන්ත්‍රවල වටිනාකම රු.20000.00ක් ලෙස ඇස්තමේන්තු කර ඇත. මෙම වත්කම සරල මාර්ග ක්‍රමයට ක්ෂය කරයි නම් වාර්ෂික ක්ෂය ප්‍රමාණය කොපමණද?

27. I. රු.24000.00   II. රු.16000.00   III. රු.8000.00   IV. රු.4000.00

28. ප්‍රවීන්ගේ ව්‍යාපාරයේ වාර්ෂික ක්ෂය සටහන් කරන ආකාරය වන්නේ,
   I. යන්ත්‍ර ගිණුම හර - යන්ත්‍ර වෙන් කිරීමේ ගිණුම බැර
   II. යන්ත්‍ර ක්ෂය ගිණුම හර - ලාභාලාභ ප්‍රකාශනය බැර
   III. යන්ත්‍ර ක්ෂය ගිණුම හර - යන්ත්‍ර ගිණුම බැර
   IV. යන්ත්‍ර ක්ෂය වෙන් කිරීමේ ගිණුම හර - යන්ත්‍ර ක්ෂය ගිණුම බැර

29. පහත සඳහන් ප්‍රකාශ අතරින් නිවැරදි ප්‍රකාශය තෝරන්න.
   I. වෙළඳ වට්ටම ,ඉක්මනින් ගෙවීම් කිරීමට කරන දිරි ගැන්වීමකි.
   II. මුදල් වට්ටම ගිණුම් ගත නොකරයි. වෙළඳ වට්ටම් ගිණුම් ගත කරයි.
   III. වෙළඳ වට්ටම් ගිණුම් ගත නොකරයි. මුදල් වට්ටම ගිණුම් ගත කරයි
   IV. වෙළඳ වට්ටම ණය ගැතියන්ට ලබා දෙයි.

30. ව්‍යාපාරයක මූල්‍ය තත්ව ප්‍රකාශය පිලිබඳ වැරදි ප්‍රකාශය තෝරන්න.
   I. වර්ෂය තුල සිදු වූ වත්කම්, වගකීම්, හිමිකම්,වෙනස්වීම් හඳුනා ගත හැකිය.
   II. නිශ්චිත දිනකට ව්‍යාපාරයක ඇති වත්කම්, වගකීම් හා ප්‍රාග්ධනයේ වටිනාකම දක්වන ප්‍රකාශයයි.
   III. ගිණුම්වල ශේෂ පදනම් කරගෙන සකස් කරනු ලැබේ.
   IV. මෙහි ඇතුලත් වන්නේ ජංගම හා ජංගම නොවන වත්කම් පමණි.

31. පහත ඒවායින් අයභාර වියදමක් ලෙස සැලකෙන්නේ,
   I. ව්‍යාපාරයට ලී බඩු මිළ දී ගැනීම.
   II. ව්‍යාපාර කටයුතු සඳහා පරිගණකයක් මිළදී ගැනීම.
   III. ව්‍යාපාරය රක්ෂණය සඳහා රක්ෂණ ආයතනයකට මුදල් ගෙවීම.
   IV. ව්‍යාපාර ආයතනයට තවත් ගොඩනැගිල්ලක් එක් කිරීම.

32. ආදායම් ලැබීම පිලිබඳව අවදානම අඩු ආයෝජන මාර්ගයක මුදල් යෙදවීමට කවීෂ අදහස් කරයි. ඒ සඳහා සුදුසු ආයෝජන ක්‍රමය වන්නේ,
   I. ඒකක භාර   II. සීට්ටු දැමීම
   III. කළඹ ආයෝජන   IV. පොළියට මුදල් දීම

33. ව්‍යාපාරයක් විසින් බැංකු සැසඳුම පිලියෙල කිරීමේ ප්‍රධාන පරමාර්ථයක් වන්නේ,
   I. බැංකුව විසින් සිදු කර ඇති වැරදි අනාවරණය කර ගැනීමට
   II. බැංකු ගිණුමේ සිදු වූ වැරදි අනාවරණය කර ගැනීමට

www.edudept.up.gov.lk

III. ශේෂ පිරික්සුමේ වැරදි අනාවරණය කර ගැනීමට
IV. මෙහෙයුම් ප්‍රතිඵලය දැනගැනීමට

34. පොදු ජ'නලයේ සටහන් කළ නොහැකි ගනුදෙනුව තෝරන්න.
I. ස්ථාවර වත්කම් ණයට විකිණීම
II. ස්ථාවර වත්කම් ණයට ගැනීම
III. ආරම්භක සටහන්
IV. ස්ථාවර වත්කම් අත්පිට ගැනීම

35. ලව්නුගේ ව්‍යාපාරයේ මාසික ගිණුම් සාරාංශයේ ශේෂය රු.20000.00 කි. ඔහු විසින් සකස් කල බැංකු ගිණුමේ ශේෂය රු.30000.00 කි. මෙම ශේෂයන්හි වෙනසට හේතුව විය හැක්කේ,
I. බැංකුවෙන් මුදල් ආපසු ගැනීම
II. අත්පිට මුදලට භාණ්ඩ ගැනීම
III. බැංකුවේ මුදල් තැන්පත් කිරීම
IV. බැංකුවේ චෙක්පත් තැන්පත් කිරීම.

*හරින් උෂාරගේ වෙලඳ ව්‍යාපාරයේ 2016.12.31දිනෙන් අවසන් වර්ෂය සඳහා ශේෂ පිරික්සුම පහත දැක්වේ.

| විස්තරය | හර | බැර |
|---|---|---|
| දළ ලාභය | - | 260000.00 |
| විදුලි වියදම් | 9000.00 | - |
| ප්‍රචාරණ ගාස්තු | 11000.00 | - |
| වරිපනම් බදු | 6000.00 | - |
| ගෙන යාමේ කුලී | 4000.00 | - |
| ණය පොලී | 3000.00 | - |
| දුන් වට්ටම් | 1200.00 | - |
| 20% බැංකු ණය | - | 50000.00 |
| මෝටර් රථ | 200000.00 | - |
| ණය ගැතියෝ | 8000.00 | - |
| ණය හිමියෝ | - | 10000.00 |
| මෝටර් රථ ක්ෂය වෙන් කිරීම් | - | 10000.00 |
| ගැනිලි | 2000.00 | - |
| ප්‍රාග්ධනය | - | 20000.00 |
| මුදල් | 105800.00 | - |
| **එකතුව** | **350000.00** | **350000.00** |

අමතර තොරතුරු පහත දැක්වේ.

1. උපචිත විදුලිය - රු.3000.00 කි.
2. ණයගැතියන්ගෙන් 5% ක් බොල් ණය වේ.
3. මෝටර් රථ 5% ක් සරල මාර්ග ක්‍රමයට ක්ෂය කළ යුතුය.
පහත සඳහන් ප්‍රශ්නවලට ඉහත තොරතුරු ඇසුරෙන් පිලිතුරු සපයන්න.

36. ලාභ හෝ අලාභ ප්‍රකාශයේ සටහන් කරන විදුලි වියදම් වල වටිනාකම,
I. රු.14000. II. රු.12000.00 III. රු.9000.00 IV. රු.6000.00

37. බෙදාහැරීමේ වියදම් වල එකතුව වන්නේ,
I. රු.26600. II. රු.26200.00 III. රු.20000.00 IV. රු.16200.00

38. මූල්‍ය තත්ව ප්‍රකාශයේ දැක්වෙන ණයගැති වටිනාකම,
I. රු.8400.00 II. රු.8000.00 III. රු.7600.00 IV. රු.7200.00

www.edudept.up.gov.lk

39. මෙම ව්‍යාපාරයේ ශුද්ධ ලාභය වන්නේ,

I. රු.200000.00 II. රු.205400.00 III. රු.200400.00 IV. රු.54600.00

40. හරීන්ගේ ව්‍යාපාරයේ මුළු හිමිකම කියද?

I. රු.225400.00 II. රු.223400.00 III. රු.205400.00 IV. රු.20000.00

www.edudept.up.gov.lk